**ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු.150,717,224 ක් වූ මෝටර් රථ, රසායනාගාර උපකරණ, කාර්යාල උපකරණ, යන්ත්‍ර හා උපකරණ, ජලය හා විදුලි උපකරණ, අස්ථාශ්‍රා වත්කම් හා සැරසිලි උපකරණ, පරිඝනක උපකරණ, ලී බඩු හා සවිකිරීම් සහ පුස්තකාල පොත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | ගොඩනැගිලි ප්‍රත්‍යාගණන කටයුතු රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන අතර ප්‍රධාන කාර්යාලය හැරුණු විට ගොඩනැගිලි පිහිටි ඉඩම් සඳහා බදු ගිවිසුම් ක්‍රියාත්මක වන අතර බදු කාලය අවසානයේ අයිතිය පැවරීමට කටයුතු කරනු ඇත. මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම පෞද්ගලික ආයතනයක් මගින් සිදු කරනු ඇත. රසායනාගාර උපකරණ පමණක් කාර්මික තාක්ෂණික ආයතනයේ සහාය ඇතිව ප්‍රත්‍යාගණන කිරීම සිදු කර ඇත. වාර්තා ලැබුණු පසු අදාල සියළුම තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදුකරනු ලැබේ. අනෙකුත් වත්කම් මණ්ඩලයේ සුදුසුකම්ලත් අභ්‍යන්තර කමිටුවක් මගින් ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ඇත. | සම්පූර්ණයෙන්ම ක්ෂය කරනු ලැබූ වත්කම්වල ඵලදායී ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මූල්‍ය ප්‍රකාශනවල රු.350,000,000 ක වටිනාකමකට දැක්වෙන ප්‍රධාන කාර්යාලයේ ඉඩම 2008 දෙසැම්බර් 31 දිනෙන් පසුව හා රු. 26,300,000 ක වටිනාකමකට දැක්වෙන ගම්පොළ ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ඉඩම 2016 ජූලි 25 දිනෙන් පසුවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 34 ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාලය ඉඩම රජයේ පිහිටි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දැනටමත් ප්‍රත්‍යාගණනය සිදු කර හමාර කර ඇති අතර එහි වාර්තාව ලැබුණු විගස මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ ඉඩම් දෙක ප්‍රත්‍යාගණනය කර අගය ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය අනුගමනය කර තිබුණද, 2019 වර්ෂයේදී සිදු කරන ලද ආයුගණක | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 මගින් නිර්දේශ කර ඇති පරිදි විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සම්බන්ධව ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය අනුව විශ්‍රාම ප්‍රතිලාභ | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පාරිතෝෂික සඳහා වන වියදම සහ |
| තක්සේරුවේ නිර්දේශයන් පදනම් කර ගෙන මූල්‍ය වර්ෂය අවසානයේදී වර්තමාන සේවා පිරිවැය සහ පොලී පිරිවැය අනුව හඳුනාගත යුතු රු. 9,459,950 ක සේවක පාරිතෝෂික සඳහා වන වියදම සහ විශ්‍රාම ප්‍රතිලාභ මත සත්‍ය ලාභය වන රු.8,502,945 ක වටිනාකම වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි කාලානුරූපීව හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය. තවද මෙම බැඳීම් පියවීමට ප්‍රමාණවත් ආයෝජනයන් සිදු කර නොතිබුණි. | වගකීම ගණනය කර ඇත. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම නිවැරදි ලෙස සිදු කොට ඇත. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් 2022 වර්ෂයේ සිට සිදු කරන අතර විශ්‍රාම ප්‍රතිලාභ වගකීම සඳහා නිශ්චිත ආයෝජනයන් කිරීමටද නිසි උපදෙස් ලබා දී ඇත. | විශ්‍රාම ප්‍රතිලාභ මත සත්‍ය ලාභය / අලාභය කාලානුරූපීව හඳුනා ගත යුතුය. බැඳීම් වලට ප්‍රමාණවත් ආයෝජනයක් සිදුකළ යුතුය. |
| (ඈ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 පරිදි සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභයට ගැලපීම කළ යුතු වුවත්,මණ්ඩලය විසින් බදු ගැලපීමෙන් පසු ලාභයට ගැලපීම් කර තිබුණි. | පෙන්වා දී ඇති කරුණු මින් ඉදිරියට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කිරීමේදී අනුගමනය කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලංකා බැංකු කොල්ලුපිටිය දෙවැනි ශාඛාවේ සහ ලංකා බැංකු බම්බලපිටිය ශාඛාවේ ගනුදෙනුකරුවන් විසින් සෘජුවම තැන්පත් කරන ලද පිළිවෙලින් රු.6,391,886 ක හා රු.7,307,960 ක මුදල් වෙනුවෙන් ආදායම් මූලාශ්‍රය හඳුනාගැනීමට නොහැකිව තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ආදායම් රු.13,699,846 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. උක්ත කොල්ලුපිටිය දෙවැනි ශාඛාවේ 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයට අනුව 2020 වර්ෂයේදී සිදුව තිබුණු බැංකු දෝෂ වශයෙන් රු.392,673 ක් දක්වා තිබුණද, 2022 අප්‍රේල් 30 විගණන දින වන විටත් එම දෝෂය නිවැරදි කොට නොතිබුණි. | කෝවිඩ් වසංගත තත්ත්වය මත ගනුදෙනුකරුවන්ගේ ප්‍රේෂණ සෘජුව බැංකු ගත කිරීමටත් එම රිසිට්පත්වල පිටපත් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වෙනම ඊ-මේල් මඟින් එවීමටත් ගනුදෙනුකරුවන්ට පැහැදිලි උපදෙස් ලබාදී තිබුනද ඔවුන් එම රිසිට්පත් හරියාකාරව තේ මණ්ඩලයට ඊ මේල් නොකිරීම මත බැංකු ගිණුම් දෙකක සෘජු තැන්පතු ප්‍රමාණයක් හඳුනා ගත නොහැකි විය. 2022 වර්ෂයේදී සොයා ගත් ගණුදෙනු මේ වසර තුළදී අවශ්‍ය ගැලපිලි සිදු කරනු ඇත. 2020 වර්ෂයේ රු.489,319ක් සහ තවදුරටත් හඳුනා නොගත් සෘජු තැන්පතු හඳුනා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. තවද බැංකු දෝෂ ලෙස දක්වා ඇති රු.392,673 ක මුදල දැනට නිරවුල් කර ඇත. | සෘජු තැන්පතු සම්බන්ධයෙන් ආදායම් මූලාශ්‍රය කඩිනමින් හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. බැංකුව විසින් සිදු කර ඇති දෝෂ වහාම නිවැරදි කරවා ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොළඹ ප්‍රධාන කාර්යාලයේ මධ්‍යගත වායුසමීකරණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුවේ ආරම්භක අත්තිකාරම් මුදල වූ රු.6,951,410 ක් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී අඩුකරගෙන තිබුණද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුම ඒ අනුව නිරවුල් කර නොතිබුණි. | මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය සඳහා වන අවසාන ගෙවීම 2022 මැයි මස 04 වන දින සිදු කොට ඇත. එම ගෙවීමේදී නිවැරදි ලෙස ගණනය කිරීම් කර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගිණුම නිරවුල් කර ඇත. | කොන්ත්‍රාත්කරුට ගෙවීම් කිරීමේදී වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හිලව් කරගෙන ගිණුම පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ණයගැති පාලන ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට රු.4,200,041 ක හඳුනා නොගත් ශේෂයක් පැවති අතර එය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම නිසා ණයගැති ශේෂය හා ආදායම එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනය තුළ වැඩියෙන් දක්වා තිබුණි. | ණයගැති පාලන ගිණුම නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව හඳුනා නොගත් ශේෂය වන රු. 455,133 ක මුදල හඳුනා ගැනීමට තවදුරටත් 2022 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | හඳුනා නොගත් ශේෂයන් කඩිනමින් හඳුනාගෙන අදාළ පරිදි ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඈ) මණ්ඩලය වෙත සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතු මාර්ගස්ථ තොග ශේෂය වූ රු. 2,434,872 න් රු. 1,869,582 ක් මාස 12 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයක් බව නිරීක්ෂණය වූ අතර, ඉන් රු. 429,229 ක තොග රසායනාගාර භාවිතයට ඇණවුම්කර ඇති රසායනික ද්‍රව්‍ය බවද නිරීක්ෂණය විය. | විමසුමේ සඳහන් මාස 12 කට වැඩි ලැබිය යුතු ද්‍රව්‍ය සඳහා වූ ශේෂයන් අතුරින් කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පැවති සංචරණ සීමා සහ භාණ්ඩ ආනයන සීමා හේතුවෙන් 2020 වර්ෂයේ ඇනවුම් කර ඇති මෙම භාණ්ඩ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත සැපයීමට අදාළ සැපයුම්කරුවන් අසමත් වී ඇත. ඒ අනුව අදාළ භාණ්ඩ ඇනවුම් පත්‍ර අවලංගු කිරීමට කටයුතු කරනු ඇත. | දීර්ඝකාලයක් පවතින මාර්ගස්ථ තොග ශේෂයන් කාලීනව පසුවිපරම් කර ගිණුම් තුළ ගැලපුම් කළ යුතුය. |
| (ඉ) තේ කර්මාන්තශාලා වැසීම, ලියාපදිංචිය අවලංගු කිරිම, කොන්ත්‍රාත් කටයුතු සහ වෙනත් සේවා ප්‍රශ්න සම්බන්ධයෙන් තෙවන පාර්ශවයන් විසින් මණ්ඩලයට විරුද්ධව පැවරූ සහ මණ්ඩලය විසින් පවරන ලද නඩු 23 ක් සමාලෝචිත වර්ෂය තුළ විභාග වෙමින් පැවතුන අතර, 2021 ජුලි 27 දින ප්‍රකාශ කරන ලද බේරුම්කරණ නඩු තීන්දුවකට අනුව මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු. 485,232 ක වන්දි මුදලක් ගෙවීමට තීන්දුවී තිබුණි. මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වගඋත්තරකරුට ගෙවිය යුතු මුදල රු.485,232 ක් වන අතර බේරුම්කරණය වෙත යොමු කිරීම මගින් මෙම අගය තීරණය කර ගැනීමට හැකිවිය. | ගෙවීමට තීන්දුවී තිබුණු වන්දි මුදල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයන් සිදු කළ යුතුය. නඩු නිමිති අවම වන පරිදි කළමනාකරණ කටයුතු සිදුකළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|
| (අ)හිටපු අමාත්‍යවරයෙකු සහ අමාත්‍යාංශයේ හිටපු අතිරේක ලේකම්වරයෙකු ඇතුළුව සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු. 1,289,086 ක් වසර 03 සිට 05 දක්වා කාලයක සිටද, කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් දැරූ රු.317,232 ක් වර්ෂ 02 සිට වර්ෂ 03 ක කාලයක සිටද, ලැබිය යුතු ශේෂයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර 2022 අප්‍රේල් 30 විගණන දින වන | හිටපු අමාත්‍යවරයා සහ අතිරේක ලේකම්ගේ විදේශ ගමන් වියදම් ලෙස රු. 957,832 ක මුදල තේ ප්‍රවර්ධන වියදම් ලෙස ගිණුම් ගත කර ඇත. සී/ස කලුබෝවිටියාන තේ කර්මාන්තශාලාවෙන් අය විය යුතු එහි හිටපු සභාපතිවරයාගේ ගුවන් ප්‍රවේශ පත්‍ර සඳහා රු.252,054 ක මුදල නිරවුල් කර ඇත. රු.79,200ක මුදල කලුබෝවිටියාන තේ කර්මාන්තශාලාවෙන් ලැබිය යුතුව ඇත. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු. | අමාත්‍යාංශයේ සහ බාහිර පාර්ශවයන්ගේ විදේශ ගමන් වියදම් වෙනුවෙන් වැය කළ මෙම මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 317,252 ක මුදල අය කර ගැනීම සඳහා ලිපි යවා ඇති අතර ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අදාළ මුදල නිරවුල් කරන බවට දැනුම් දී ඇත. 2022 වර්ෂයේදී මෙම මුදල නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බැව් දැනුම් දෙමි. | |
| (ආ) 2017 වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තානාපති කාර්යාල වෙත ලබා දුන් රු.51,604,457 ක මුදලින් රටවල් 15 ක ඉතිරි වූ රු.918,679 ක මුදල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආපසු ගෙන්වාගෙන නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට විදේශ තානාපති කාර්යාල 07 කින් අය කර ගත යුතු මුදල දැනටමත් විදේශ කටයුතු අමාත්‍යාංශයට ප්‍රේෂණය කර ඇති අතර විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මෙම අත්තිකාරම් මුදල් වහාම පියවාගත යුතුය. |
| (ඇ) චීනය, එක්සත් රජධානිය, ජර්මනිය සහ මොස්කව් යන විදේශ රටවලින් ලැබිය යුතු වූ රු.868,578 ක මුදල අදාළ තානාපති කාර්යාලවලින් ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණු නමුත්, විගණන දින වන විටත් එම අමාත්‍යාංශයෙන් මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත 2021 දෙසැම්බර් 31 දිනට අය කර ගත යුතු මුළු මුදල අය කර ගැනීමට ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂය තුළදී කිහිප වරක් ලිඛිතව ඉල්ලීම් කර සාකච්ඡා කර ඇත. විදේශ කටයුතු අමාත්‍යාංශය මේ පිළිබඳව සාධනීය පිළිතුරක් මේ වන තුරුත් ලබා දී නොමැත. | ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් කඩිනමින් මුදල් අයකර ගැනීමට වගකිව යුතු පාර්ශවයන් විසින් කටයුතු කළ යුතුය. |
| (ඈ)ලැබිය යුතු ශේෂය තුළ ඇතුළත් රු. 679,123 ක් වටිනා "සිලෝන් තේ" සන්නාමය සහිත ශ්‍රී ලංකා ක්‍රිකට් ටී ෂර්ට් විකිණීම වෙනුවෙන් ලැබියයුතු ශේෂය වසර 05 කට වැඩිකාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින අතර 2022 අප්‍රේල් 30 විගණන දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.679,123 ක් වටිනා ශ්‍රී ලංකා නිල ටී ෂර්ට් වටිනාකම 2013 වර්ෂයේ සිට පැවත එන්නකි. විදේශ රටවලට ලබා දී ඇති නිල ටී ෂර්ට් සඳහා ලැබිය යුතු මුදල් අය කර ගැනීම ප්‍රයෝගිකව දුෂ්කර කාර්යයකි. මෙම මුදල අලාභයක් ලෙස ලියා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |
| (ඉ) එක්සත් අරාබි එමීර් රාජධානි විදේශ තානාපති කාර්යාලයෙන් හා මොස්කව් විදේශ තානාපති කාර්යාලයෙන් 2010 සහ 2017 වර්ෂයන්හි සිට ලැබිය යුතු ආරක්ෂක තැන්පතු පිළිවෙලින් රු.249,130 ක් හා රු.203,847 ක මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තේ ප්‍රවර්ධන ඒකකයේ හිටපු නිලධාරියාගේ නිල නිවස සඳහා ගෙවන ලද අත්තිකරම් මුදල අය කර ගැනීම ප්‍රයෝගිකව දුෂ්කර බැවින් මෙම මුදල අලාභයක් ලෙස ලියා හැරීමට ඊලඟ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. |
| (ඊ) 2019 වර්ෂයේදි ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කම්කරුවන්ට දීපවාලී උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා රු. | දීපාවලි උත්සවය සඳහා ඇල්කඩුව වැවිලි සමාගම වෙත ලබාදී ඇති මුදල නිරවුල් කර ගැනීමට අවස්ථා | වැවිලි සමාගමෙන් හෝ වගකිව යුතු පාර්ශවයන්ගෙන් |

| | | |
|---|---|---|
| 8,760,400 ක ණය මුදලක් ඇල්කඩුව වැව්ලි සමාගම වෙත මණ්ඩලයේ තේ ප්‍රවර්ධන අරමුදලින් ගෙවා තිබුණි. මෙම අත්තිකාරම් මුදල ගෙවා වසර 02ක් ඉක්මවා ගියද 2021 දෙසැම්බර් 31 දිනට එම ශේෂයෙන් කිසිදු මුදලක් අයකර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | කිහිපයකදී දැනුම් දුන් නමුදු ඊට යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. මෙම මුදල් කඩිනමින් නිරවුල් කරන ලෙස ඔවුන් වෙත දන්වා යවා ඇත. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) චීනයේ ඇති තේ ප්‍රවර්ධන ඒකකය සඳහා 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වාහනය වෙනුවෙන් චීන රජය මඟින් චීන තානාපති කාර්යාලය වෙත ආපසු ගෙවන ලද රු. 889,870 ක් (RMB 33, 389.74) 2021 වර්ෂය අවසානය දක්වා මණ්ඩලය වෙත ගෙන්වා ගෙන නොතිබුණි. | මෙම මුදල චීන තානාපති කාර්යාලය විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර ඇත. මේ සම්බන්ධයෙන් අවස්ථා කීපයකදී විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කලද ඔවුන් මෙම මුදල ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොමැත. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී මුණ ගැසී මේ සම්බන්ධයෙන් අදාළ මුදල ගෙන්වා ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් කඩිනමින් මුදල් ගෙන්වා ගැනීමට වගකිව යුතු පාර්ශවයන් විසින් කටයුතු කළ යුතුය. |
| (ඌ) ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදල මඟින් සිදුකරන ලද ප්‍රේෂණයන් විශ්ලේෂණයේදී මුදල් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය යන ආයතන වෙත අරමුදල විසින් ලබා දී ඇති රු. 1,209,000,000 ක ණය මුදල් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අමාත්‍යාංශය වෙත ලබා දී ඇති මුදල් නැවත අයකර ගැනීමට ලිපියක් යැවීමටත් , ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබා දී ඇති අරමුදල ලබාගැනීමට දෙපාර්ශවය සමග සාකච්ඡාවක් කැඳවීමටත් අමාත්‍යාංශ ලේකම් විසින් දැණුම් දී ඇත. | අදාළ පාර්ශවයන්ගෙන් ණය මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>--------------------- | නිර්දේශය<br>--------------- |
|---|---|---|
| (අ)තේ කම්හල්හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා මණ්ඩලයේ තැන්පත් කර ඇති තැන්පතු මුදල් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වසර 1 සිට 19 දක්වා එනම් 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා නිරවුල් නොකරන ලද තැන්පතු ප්‍රමාණය රු. 6,908,583 කි. එය මුළු තැන්පතු ප්‍රමාණය වන රු.8,935,369 න් | හරිත තේ සපයන්නන් සඳහා ගෙවිය යුතු තැන්පතු මුදල් පිළිබඳ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී. එහි ප්‍රගතිය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර 2000 වර්ෂයේ සිට 2019 වසර දක්වා වන තැන්පතු ඉල්ලුම් ඉදිරිපත් වුවහොත් ආපසු ගෙවීමේ පදනම මත ආදායමට ආපසු ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | ගෙවිය යුතු පාර්ශව නිවැරදිව හඳුනාගෙන කඩිනමින් නිරවුල් කළ යුතුය. |

| | | |
|---|---|---|
| සියයට 77 කි. මේ අනුව පරීක්ෂණ වලින් පසුව මෙම මුදල් ගෙවා නිම කිරීම හෝ ප්‍රතිලාභීන් නොමැති නම් ආපසු තැන්පත්කරුවන් වෙත මුදල් හරවා යැවීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | | |
| (ආ) 2015 වර්ෂයේ අමු තේ දලු සඳහා රු.80ක අවම මිලක් පවත්වාගැනීම සඳහා දලු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු සහනාධාර මුදලින් ගෙවීම් සිදු නොකර ඉතිරි වූ රු.912,229 ක් ගිවිසුම් ප්‍රකාරව භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට විගණිත දින දක්වා කටයුතු කර නොතිබුණි. | අමු තේ දලු සඳහා රු. 80/- ක මිලක් පවත්වා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ සහනාධාර මුදලින් ඉතිරි රු.912,229/- ක මුදල ගෙවීම් කිරීමට සුදුසුකම් සපුරා නොමැති හෙයින් වැවිලි අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශයට ප්‍රේෂණය කිරීමට චෙක්පතකින් නිරවුල් කර ඇති බව දන්වමි. | ඉතිරි සහනාධාර මුදල් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ----------- | ---------------- | ---------------- | --------------- |
| (අ)1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති | පනතේ විධිවිධාන අනුව රේගු දෙපාර්තමේන්තුව විසින් අයකළ සෙස් බදු, තේ මණ්ඩලයේ අරමුදලකට බැර කළයුතු නමුත් සෘජුවම මහා භාණ්ඩාගාරය වෙත බැර කර තිබුණි. | මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා රේගුව වෙත ලබා දී ඇති නියෝග පරිදි මෙම සෙස් බදු මුදල සෘජුවම මහා භාණ්ඩාගාරය විසින් එකතු කර ගනු ලැබේ. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ.715(2)(ඉ) | භාණ්ඩ භාරගැනීම, භාරයේ තබා ගැනීම හා නිකුත් කිරීම යන කාර්යයන් පවරනු ලැබ සිටින ගබඩා භාරකරු විසින් බඩු බාහිර ලැබීම්, නිකුත් කිරීම් නියාදනයන් සම්බන්ධයෙන් නියමිත ආකාරයෙන් රෙජිස්ටර හා ගිණුම් තබා ගත යුතු වුවත්, 2021 අප්‍රේල් 09 දින සිට එදිනට පැවති භෞතික තොග ශේෂය සඳහන් කර නව ගබඩා ලේඛනයක් ආරම්භ කර තිබුණු අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ඉකුත් මාසයන්ට අදාළ | ගබඩා භාරකරු විසින් 2021 අප්‍රේල් 09 දිනට පසුව භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධ සටහන් සියල්ල ලේඛන ගත කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බඩු ලේඛන පොත් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගනුදෙනු කිසිවක් එහි ඇතුළත් කර නොතිබුණි. | | |
| (ඇ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් රු. 8,544,639,497ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණු නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ස්ථාවර තැන්පතු වල ආයෝජනය නිසි පරිදි ආයෝජන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ඔවුන්ගේ උපදෙස් මත රාජ්‍ය බැංකුවල පමණක් වඩාත් වාසිදායක පොලී අනුපාත යටතේ විනිවිදභාවයකින් යුතුව සිදු කරනු ලැබේ. මේ<br><br>සඳහා මුදල් පනතේ විධිවිධාන අනුව මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගනු නොලැබේ. | ආයෝජනයට පෙර අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |
| (ඈ) මු. රෙ. 756 (9) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර අවසන් කිරීමේ කාල රාමුව අනුව මණ්ඩලය 2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි මුදල් වර්ෂයේ ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත්,2022 ඔක්තෝබර් 31 විගණන දින වන විටත් එසේ කටයුතු කර නොතිබුණි. | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වැඩ කටයුතු සියයට 80 ක් පමණ සිදු කර ඇත. පැවති ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රාදේශීය කාර්යාල 03 ක සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නියමිතයි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතුය. |

**1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>------------------ | නිර්දේශය<br>------------ |
|---|---|---|
| (අ) ව්‍යාපාර ආදායම් සහ වෙනත් ගාස්තු අයකිරීම් වැනි ආදායම් සඳහා බදු නිදහස් කිරීමක් ලබාගත් බවට සාක්ෂි නොතිබුණද, මණ්ඩලය විසින් ආයෝජන ආදායම් සඳහා හැර එබඳු වෙනත් ආදායම් සඳහා ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණු බව විගණනයේදී | ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් දේශීය ආදායම් පනත ප්‍රකාරව 2021 වර්ෂය දක්වා පොලී ආදායම මත පමණක් ආදායම් බදු ගෙවන ලදී. මීට පෙර අවස්ථාවන්හිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරීන් පවා රජය සතු ව්‍යාපාරයන්හි බදු වගකීම පිළිබඳව නිශ්චිත | දේශීය ආදායම් බදු පනතට අනුකූලව බදු ගෙවීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

| | |
|---|---|
| නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ආයෝජන ආදායම් සඳහා බදු වියදම රු.5,344,262 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අදාළ බදු වියදම වශයෙන් රු.4 ,961,057 ක් පමණක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව බදු වියදම හා ගෙවිය යුතු වියදම රු.383,205 කින් අඩුවෙන් ගලපා තිබුණි. | පිළිතුරක් ලබා දී නොමැති අතර බදු පැහැර හැරීමක් වී ඇති බවට පවා වාර්තා කර නැත. කෙසේ නමුදු දේශීය ආදායම් බදු සංශෝධන පනත අනුව අඩුවෙන් ගලපා තිබු රු.383,205 ක බදු මුදල දේශීය අදායම් බදු දෙපාර්තමේන්තුව වෙත 2022 මැයි 05 දින ගෙවා ඇති බැව් තහවුරු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 8,194,033 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 21, 447,654 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 29,641,687 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන සියයට 30 කින් සහ රසායනාගාර ආදායම් සියයට 103 කින් වැඩිවීම හා තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදලේ පොලී ආදායමෙන් තේ මණ්ඩලය වෙත මාරු කරන ලද මුදල් ප්‍රමාණය සියයට 70 කින් වැඩිවීමත් හා මූල්‍ය වියදම් සියයට 97 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය 1 : 14 ක ඉහළ අගයක් විය. ප්‍රචාරණ හා ප්‍රවර්ධන අරමුදලේ කෙටිකාලීන ආයෝජන එනම් ස්ථාවර තැන්පතු මුළු ජංගම වත්කම්වලින් සියයට 84 ක් නියෝජනය වීම ඊට බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය<br>---------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------------- | නිර්දේශය<br>---------------- |
|---|---|---|
| (අ) තේ මණ්ඩලයට අයත් අංශ 02 ක කටයුතු පවත්වා ගෙන යාම සඳහා 2021 පෙබරවාරි 01 දින සිට යාබද ගොඩනැගිල්ලක් හා වාහන ගාල් කිරීම සඳහා හිස් ඉඩමක් රු. 100,000 ක මාසික බදු කුලී පදනම මත වසර 02ක කාලපරිච්ඡේදයක් සඳහා ගිවිසුම්ගතව ලබා ගෙන ඇත. එහෙත් බදු මුදලින් රු.50,000 ක වටිනාකමට ලබාගත් හිස් ඉඩම | තේ රස බැලීමේ ඒකකය පවත්වාගෙන යාම අවධානමක් බව අදාළ තාක්ෂණික වාර්තාව අනුව පෙන්නුම් කළ බැවින් තේ මණ්ඩලයට යාබද වූ ගොඩනැගිල්ල ක් විධිමත් පරිදි තක්සේරු වාර්තා ලබාගෙන කුලියට ගැනීමට සැලසුම් කළේ 2020 සැප්තැම්බර් මාසයේදී වන අතර ඒ වන විට මණ්ඩලයට සේවා ලබාගැනීමට පැමිණි | ප්‍රසම්පාදන ගිවිසුම් වලට එළඹීමේදී මූලික අරමුණ සහ වියදමට සාපේක්ෂව ආර්ථික වාසිය පිළිබඳව සලකා කටයුතු කළ යුතුය. ලබාගත් ඉඩම ඵලදායී කාර්යන් සඳහා උපයෝජනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| යෝජිත අරමුණ සඳහා යොදාගෙන නොතිබුණි. ඒ අනුව නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව එලඹී ගිවිසුම් තුළින් වසර 02 ක කාලයක් සඳහා රු.1,200,000 ක මුදලක් අනාර්ථික වියදමක් ලෙස තේ මණ්ඩලයට දැරීමට සිදුව ඇතිබව තවදුරටත් නිරීක්ෂණය විය. | පාර්ශවකරුවන් වාහන ගාල් කිරීම සම්බන්ධව තිබූ අපහසුතාවය ද සලකා එම ගොඩනැගිල්ල සමග ඇති හිස් ඉඩමද කුලියට ගැනීමට කටයුතු කරනු ලැබිණ. නමුත් කෝවිඩ් 19 වසංගතය හමුවේ මෙම ඉඩම නියමාකාරයෙන් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. එම කොටස නැවත හිමිකරු වෙත නිදහස් කිරීමේ හැකියාව පිළිබඳ ගොඩනැගිලි හිමිකරුගෙන් විමසූ නමුත් වර්ෂ 02 කාලයකට ගිවිසුම් ගත වී තිබූ බැවින් ඔහු එම කොටස පමණක් නැවත භාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. | |
| (ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ තේ අලෙවිසැලෙහි ක්‍රියාකාරීත්වය පැවරීමේ කොන්ත්‍රාත්තුව වසර 6 ක කාලයක් සඳහා රු.8,162,296 ක බදු මුදලකට, ගෙවීමේ හැකියාව පරීක්ෂා කිරීමෙන් තොරව පුද්ගලික පාර්ශවයකට ගිවිසුමකින් පවරාදී තිබුණි. ඒ හේතුවෙන් 2019 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී නුවරඑළිය තේ අලෙවි සැලෙන් මණ්ඩලයට අයවිය යුතු රු.2,298,572 ක බදු මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2019 වර්ෂයේ සිට 2021 දෙසැම්බර් මස දක්වා අයවිය යුතු මුදලින් රු.1,312,320 ක මුදලක් අය කරගෙන ඇත. හිඟ මුදල් වශයෙන් සඳහන් රු. 986,253 ක මුදල බදු මුදල නිසි වෙලාවට නිරවුල් නොකරන්නේ නම් අය විය යුතු අධිභාර මුදලකි. මෙම අධි භාර මුදල් සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියා කරනු ලැබේ. | හිඟ බදු මුදල් නිසියාකාරව අයකර ගැනීම කළ යුතුය. |
| (ඇ) මණ්ඩලය විසින් 2003 සැප්තැම්බර් 19 දින ලබාදෙන ලද රු. 25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි “Ceylon Tea Museum” හි අයිතිය පවරා ගැනීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ | ජනතා වතු සංවර්ධන මණ්ඩලය සමඟ විවිධ වූ සාකච්ඡාවන් පැවැත්වූවද 2022/05/03 දින ජනවසම විධායක නිලධාරීගේ ලිපිය ප්‍රකාරව හිඟ බදු මුදල් 2001 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ගණනය කරන ලදුව රු.මි.31.5 ක මුදලක් නිරවුල් කරන ලෙස දන්වා ඇත. එම ලිපියට පිළිතුරු ලෙස අප විසින් ලබාදුන් ණය මුදල රාජ්‍ය | දේපළෙහි අයිතිය පවරා ගැනීම සහ ණය මුදල් ගෙවීම සම්බන්ධයෙන් නිශ්චිත එකඟතාවයකට කඩිනමින් එළඹිය යුතු වේ. ඒ අනුව නිරවුල් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කාරක සභාවේ නියෝග අනුව තීරණයකට එළඹ තිබුණු නමුත්, මේ දක්වා වර්ෂ 09 කට වැඩි කාලයක් ගත වුවද මෙම ක්‍රියාවලිය අවසන් කරගෙන නොතිබුණි. Ceylon Tea Museum හි අයිතිය පවරාගැනීම හා ණය මුදල් ලබාදීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර කිසිදු ගිවිසුමකට එළඹ නොතිබුණි. තවද අංක 2020/492/65 දරන කළමණාකරන මණ්ඩල තීරණය අනුව 2020 පෙබරවාරි 27 දින ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතුයායේ කම්කරු වැටුප් ගෙවීම සඳහා තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට නැවතත් රු.10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර ඉන් රු.1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි. | බැංකුවක ආයෝජන කලේ නම් ලැබිය යුතු පොලිය ගණනය කර ඒ පිළිබඳව ඔවුන් දැනුවත් කර ඇත. මේ සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡා කර නිශ්චිත එකඟතාවයකට කටයුතු කරනු ලැබේ. | |
| (ඇ)මණ්ඩලය විසින් 2019 වර්ෂය අවසානය වන විට රු. 211,115,401 ක් වැයකර ගොඩනැගිලි ඉදිකර තිබුණු නුවරඑළිය, බණ්ඩාරවෙල හා රත්නපුර ප්‍රදේශයන්හි පිහිටි ඉඩම් 3 ක අයිතිය නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයට අයත් ඉඩම අත්පත් කර ගැනීම සම්බන්ධව නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත 2021.02.16 දින ලද ඉල්ලීම සිදු කර ඇත. ඒ අනුව මෙම ඉඩම් නිත්‍යානුකූලව තේ මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. බණ්ඩාරවෙල හා රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයන්ට අයත් ඉඩම් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබා ගෙන ඇති බැවින් නීත්‍යානුකූලව තේ මණ්ඩලය වෙත පවරා ගැනීමට හැකියාවක් නොමැත. | ගොඩනැගිලි ඉදිකර තිබෙන ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුයි . |
| (ඉ)කළුතර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යනු ලබන ඉඩම 2014 වර්ෂයේ සිට අවුරුදු 30 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලයේ | බදුරලිය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යන ඉඩම දීර්ඝකාලීන බදු පදනම මත ලබාගෙන ඇති අතර 2021.08.24 දිනැතිව බදු ගිවිසුම සකස් කර යොමු කරන ලෙස දන්වා ඇත. ප්‍රාදේශීය ලේකම් | කඩිනමින් බදු ගිවිසුමකට එළඹිය යුතුය. |

| | | |
|---|---|---|
| අනුමැතිය ලබා දී තිබුණද 2022 අප්‍රේල් 30 දක්වා අදාළ බලධාරියා වන පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් සමඟ බදු ගිවිසුමකට අත්සන් තබා නොතිබුණි. | කාර්යාලයේ පවතින යම් ප්‍රමාදයන් හේතුවෙන් මෙතෙක් එම කටයුතු නිමාවකට පත් වී නොමැත. කෙසේ වුවද බදු ගිවිසුම්ගත වීම සඳහා නොකඩවා ඉල්ලීම් සිදු කරන බව දන්වමි. | |
| (ඊ) ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස් " නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීමෙන් රු.62,603,006 ක අලාභයක් ඇතිවීම සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති සභාපති ඇමතූ ලිපිය මඟින් අපරීක්ෂාකාරී ලෙස කටයුතු කළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් කර තිබුණද එය නොතකා හරිමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විනය ක්‍රියාමාර්ග ගැනීම නුසුදුසු බව තීරණය කර තිබුණි. මෙම අලාභය නිලධාරීන්ගෙන් හෝ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගෙන් අය කර ගැනීමට 2022 අප්‍රේල් 30 දක්වා කටයුතු කර නොතිබුණි. | ටී මොමන්ට්ස් කම්ටු අලෙවි මධ්‍යස්ථානය ඇති කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් වන අතර ඊට නිලධාරීන්ගේ මැදිහත්වීමක් සිදු නොවන ලදී. එම නිසා සිදු වී ඇති අලාභය සම්බන්ධයෙන් නිලධාරීන් වගකිවයුතු නොමැති නිසා ඔවුන්ට විරුද්ධව ක්‍රියා කිරීම උචිත නොවන බැවි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. | මෙම අලාභය නිලධාරීන්ගෙන් හෝ අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගෙන් අය කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ----------------------------- | ------------- |
| (අ) සමාලෝචිත වර්ෂයේදී මහනුවර හන්තානෙහි පිහිටි " සිලෝන් ටී මියුසියම් " හි කිසිදු ටිකට් පත් අලෙවි ආදායමක් නොමැතිව තිබියදී වියදම රු. 3,000,000 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර, එය පසුගිය වර්ෂයේ වියදමට සාපේක්ෂව සියයට 41 ක වැඩි වීමක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය වේ. මේ මඟින් සිදුවන කාර්යභාරය සහ ප්‍රවර්ධන හා ප්‍රචාරණ දායකත්වය නැවත සමාලෝචනය කළ යුතු බව නිරීක්ෂණය විය. | ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයේ වැදගත්කම පෙන්නුම් කරන ඓතිහාසික වටිනාමක් ඇති එකම රාජ්‍ය ආයතනය තේ කෞතුකාගාරය වන බැවින් එම ආයතනය 2003 වර්ෂයේ සිට 2019 වර්ෂය අවසානය දක්වා ටිකට්පත් විකිණීමෙන් ස්වයං උත්පාදිත ආදායමක් පවත්වාගෙන ගිය අතර මිලියන 11 ක ස්ථිර තැන්පතුවක්ද පවත්වාගෙන යන ලදී. නමුත් 2019 අප්‍රේල් මස සිදුවූ පාස්කු ප්‍රහාරයත් සමඟම සංචාරක | ප්‍රමාණවත් ආදායමක් ලබාගැනීමට උපායමාර්ගික සැලසුමකට අනුව කටයුතු කළ යුතුවේ. සිලෝන් ටී මියුසියම් හි වියදම් පාලනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කර්මාන්තයේ බිඳ වැටීමත් සමඟම සංචාරකයින්ගේ පැමිණීම නැවතුණි. සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වන තුරු අවම වියදම් යටතේ තේ කෞතුකාගාරය පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත. ඒ සඳහා තේ කර්මාන්තයේ ප්‍රධාන ආයතනය වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රවර්ධන අරමුදලින් යම්කිසි මුදලක් වෙන්කිරීම සිදුකර ඇත. | |
| (ආ) 2012 වර්ෂයේ සිට 2016 දක්වා වූ පස් අවුරුදු කාලපරිච්ඡේදය තුළ “ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා උපාය මාර්ගික සැලැස්මක්” ක්‍රියාත්මක කිරීම සඳහා 2011 දෙසැම්බර් 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී තිබුණි. අපනයනකරුවන්ගෙන් රැස්කර ගන්නා බදු මුදලින් රු. බිලියන 8ක් යොදවා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු අතර එම කටයුතු සඳහා 2021 දෙසැම්බර් 31 වන විට රු.297,890,836 ක් වැයකර තිබුණි. ඒ වෙනුවෙන් නිර්මාණය කළ වෙළඳ දැන්වීම් රුසියාවේ NTV මාධ්‍ය හරහා පමණක් විකාශය කර තිබුණු අතර අපේක්ෂිත අනෙකුත් රටවල් 9 හි එම දැන්වීම් විකාශය කර නොතිබුණි. තවද මෙම වැඩසටහනට අදාළව 2019 සැප්තැම්බර් මස රුසියාවේ පුද්ගලික සමාගමක් වෙත රු.29,832,302 ක් ගෙවා රුසියාව සහ යුක්රේනය යන රටවල දී මාධ්‍ය සමුළුවක් පැවැත්වුවද, ඊට සමගාමීව තේ රස බැලීමේ වැඩසටහන් පැවැත්වීම හැර ප්‍රවර්ධන වැඩසටහනෙහි මහජන සම්බන්ධතා ප්‍රචාරණ කටයුතු සිදුකර නොතිබුණි. | 2015 නොවැම්බර් 06 දින නිර්මාණාත්මක නිෂ්පාදන සඳහා ගිවිසුම් ගත වුවද මාධ්‍ය මිලදී ගැනීම සඳහා උපදේශන සේවා ලබා ගැනීමට ගිවිසුම් ගත වන්නේ 2018 මාර්තු 21 වන දිනය.ඒ අනුව රු. 99,630,039 ක් වැය කර නිෂ්පාදනය කරන ලද රූපවාහිනී වෙළෙඳ දැන්වීම මාධ්‍ය විකාශනය සඳහා යොදා ගැනීමට ප්‍රමාද විය. ඉහත ප්‍රමාදයන් හේතු කොට ගිවිසුම වසර 4කුත් මාස 06 ක් (වාර 03 යටතේ) දීර්ඝ කරන ලද අතර 2019 නොවැම්බර් 16 වන දිනට පසු නව පාලන අධිකාරිය මගින් මෙම වැඩසටහන නැවත සමාලෝචනය කිරීමට තීරණය කර විවිධ මට්ටම් වලදී ලබාගත් තීරණ මත නව කැබිනට් මණ්ඩල සංදේශයක් සඳහා අමාත්‍යාංශයට මේ වන විට කරුණු ඉදිරිපත් කර ඇත. | තේ ප්‍රවර්ධනය කිරීම උදෙසා උපාය මාර්ගික සැලැස්ම අප්‍රමාදව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff | වාර්ෂිකව ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන තේ කිලෝග්‍රෑම් මිලියන 15 ක කෝටා සීමාවක් දක්වා තේ අපනයනයට අදාළ තීරුබදු වලින් 50% ක | නිදහස් වෙළඳ ගිවිසුම්වලින් උපරිම ප්‍රතිඵල අත්කර ගැනීමට ඇති බාධා |

| | | | |
|---|---|---|---|
| | Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් වාර්තා කිරිමට 2021 වර්ෂයේදීද හැකි වී නොතිබුණි.ඉන්දු ශ්‍රී ලංකා සහ පාකිස්තාන ශ්‍රී ලංකා වෙළද ගිවිසුම් යටතේ වසරකට පිළිවෙලින් කි.ග්‍රෑ.මිලියන 15 ක් සහ 10 ක් වශයෙන් කෝටා වෙන්කර තිබුණද එයින් උපයෝජනය කර තිබුණේ පිළිවෙලින් කි.ග්‍රෑ.74,006 ක් සහ කි.ග්‍රෑ.34,710ක් එනම් සියයට 0.49 ක් හා 0.35ක් පමණි. | අඩුවීමක් ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම හරහා ලබාදී තිබේ.<br>තීරුබදු නොවන බාධක හේතුවෙන් ගිවිසුම හරහා කෝටාව උපරිමව ප්‍රයෝජනයට නොගෙන පවතින අතර සෑම වසරකම පාහේ තේ කිලෝග්‍රෑම් මිලියනයකට වඩා අඩු ප්‍රමාණයක් අපනයනය කෙරේ.<br>පකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ පකිස්ථානය විසින් ශ්‍රී ලංකාවට තීරුබදු රහිත පදනම මත මෙට්‍රික් ටොන් 10,000 ක වාර්ෂික කෝටාවක් ලබා දී ඇතත් ශ්‍රී ලංකාවේ තේ වල මිල ඉතා ඉහළ අගයක පැවතීම, පකිස්ථානය තුළ කෙන්යානු තේ සඳහා දැඩි ඇල්මක් දක්වීම හේතුවෙන් ශ්රී ලංකා තේ අපනයනකරුවන් මේ දක්වා තීරුබදු ප්‍රතිලාභ පිලිබඳ අපේක්ෂාවන් සපුරා නොමැත. ශ්‍රී ලංකා තේ මණ්ඩලය මේ වනවිට ශ්‍රී ලංකා තේ සඳහා බදු සහන විශේෂ වූ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමක් වාණිජ දෙපාර්තමේන්තුව හරහා සිදු කර ඇත. | මගහරවා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනයද අපනයනයද ක්‍රමිකව වර්ධනය නොවීමෙන් අන්තර්ජාතික තේ කමිටු ප්‍රවෘත්ති අතිරේකය (Supplementaryto International Tea Committee News Bulletin) අනුව 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සියයට 18 ක් වුවද සමාලෝචිත වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස සියයට 15 ක් දක්වා පහළ බැස තිබුණි. | ඒ අනුව ගෝලීය වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන කොටස සියයට 18 සිට සියයට 14.6 දක්වා පහල යාම සැළකීමේදී ඊට සාපේක්ෂව ගෝලීය තේ නිෂ්පාදනයේ ඉහත අයුරින්ම ශ්‍රී ලංකා තේ වල නිෂ්පාදන කොටස 2011 වර්ෂයේදී සියයට 7 ක්ව පැවතියද සමාලෝචිත වර්ෂය වනවිට එය සියයට 4.4 දක්වා පහල බැස ඇත.ගෝලීය වසංගත තත්ත්වයේ බලපෑමද මේ සඳහා හේතු සාධක විය. | තේ නිෂ්පාදනය සහ ගෝලීය වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන කොටස වර්ධනය කරගැනීමට ගුණාත්වයෙන් යුතු අන්තර්ජාතික ප්‍රමිතීන් වලට අනුව සුදුසු තේ වෙනුවෙන් ආයෝජනය පුළුල් කළ යුතුය. |
| (ඉ) | 2021 වර්ෂය අවසානයට මණ්ඩලයෙහි ලියාපදිංචි මුළු දේශිය තේ ඇසුරුම්කරුවන් සංඛ්‍යාව 1,016 ක් | ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ සහ | ඇසුරුම්කරුවන් ලියාපදිංචිය අලුත්කිරීම |

| | | |
|---|---|---|
| වූ අතර වර්ෂය තුළදී අලුතින් ලියාපදිංචි වූ ඇසුරුම්කරුවන් සංඛ්‍යාව 116 කි. ලියාපදිංචි මුළු දේශීය තේ ඇසුරුම්කරුවන් අතුරින් 176 ක් පමණක් ලියාපදිංචිය අලුත් කර තිබුණු අතර එය මුළු ප්‍රමාණයෙන් සියයට 17 කි. ඒ අනුව දේශීය තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචිය අලුත්කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයෙහි අධීක්ෂණය සතුටුදායක මට්ටමක නොපැවති බව නිරීක්ෂණය විය. | රැස්වීම් වලදී දේශීය තේ අසුරුම්කරුවන් තේ මණ්ඩලයේ බලපත්‍ර ලබා ගත යුතු බවට මහජනතාව ජාතික මට්ටමින් දැනුවත් කරනු ලබන අතර පුවත්පත් මගින් දැන්වීම්ද පල කරනු ලැබේ. තේ මණ්ඩලයේ ලියාපදිංචි වී එහෙත් ලියාපදිංචිය අලුත් නොකරන ලද සියලු ලියාපදිංචි කිරීම් අවලංගු කිරීමට සහ ප්‍රධාන ලිපි ගොනු යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. | සම්බන්ධයෙන් මණ්ඩලයෙහි ප්‍රමාණවත් අධීක්ෂණයක් කර ඇසුරුම්කරණයේ ප්‍රමිතිය රැක ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) ශ්‍රී ලංකාවේ කලාප හත තුළ නිෂ්පාදිත තේ රසයන් හත ඇසුරුම් කිරීම සඳහා මණ්ඩලය සඳකඩපහණ තේමාව යොදාගෙන ඇසුරුම් පෙට්ටි නිර්මාණය කර තිබුණු අතර උඩුපුස්සැල්ලාව කලාපයට අදාළ හිස් ඇසුරුම් පෙට්ටි 620 ක් එහි සම්මත තත්ත්වයෙහි නොපැවතීම නිසා ඉවත්කර තිබුණු බව නිරීක්ෂණය විය. අනෙකුත් කලාපවලට අදාළ මුද්‍රිත ඇසුරුම් 4,340 ක් අදාළ සමාගමේ ගබඩා කර තිබියදී නව තේමාවක් යටතේ වෙනත් පැහැයකින් සඳකඩපහණ තේමා ඇසුරුම වෙනස් කිරීමට කටයුතු කර තිබූ බැවින් ඉතිරි ඒකක 4,340 ක ඇසුරුම් තොගය ගබඩා තුළ නිෂ්කාර්ය ලෙස පැවතුණි. | කලාප 07 තුළ නිෂ්පාදිත තේ තොගයන්හි ඇසුරුම් මෝස්තරය වෙනස් කිරීමට තීරණය කරන ලද්දේ අසුරුම්කරුගේ ඉතිරි තොග තත්ත්වයන් සැලකිල්ලට ගෙනය. මේ අනුව අලුත් මෝස්තරයට අදාළ තොග භාවිතයට ගන්නා ලෙසත් ඉතිරි තොගය ඉවත් කරන ලෙසත් ඔවුන් වෙත දන්වා ඇත. | ගබඩා තුළ පවතින තොග මනාව පාලනය කර නාස්තිය සහ වංචාවන් සිදුවීමේ අවධානම අඩුකර ගැනීමට පියවර ගත යුතුය. |
| (උ) නියමිත ප්‍රමිතියට අනුකූල නොවන නිසා පසුගිය කාලපරිච්ඡේදයන් තුළ ප්‍රතික්ෂේපිත වූ හිස් ඇසුරුම් තොග ආසන්න වශයෙන් ඒකක 65,035 ක පමණ තොග වටිනාකම අදාළ පුද්ගලික සමාගමෙන්, මණ්ඩලය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන තිබුණද උක්ත සඳහන් තොග ඉවත්කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ හා 'සිලෝන් ටී' සන්නම් නාම සහිත මෙම ප්‍රතික්ෂේපිත හිස් ඇසුරුම් තොග මණ්ඩලය මූලික වීමෙන් විනාශ කිරීමට හෝ ඉවත් කිරීමට කටයුතු නොකිරීමෙන් මෙම තොග අවභාවිත වීමේ හැකියාවක් පවතින බව | මෙම ඇසුරුම් තොගය කඩිනමින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඇසුරුම් අවභාවිතා වීම වැලැක්වීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| විගණනයේදී නිරීක්ෂණය විය.<br>(ඌ)තේ මණ්ඩලය විසින් 2019 වර්ෂයේදී ආරම්භකර ඇති තේ වගාබිම් යාන්ත්‍රිකරණයට ලක්කර ආදර්ශ තේ වගා බිම් පිහිටුවීමේ ව්‍යාපෘතිය මගින් (Model Tea Gardens Project) අදියර 4 ක් යටතේ අනුමත එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.1,000,000 ක සහනාධාර ගෙවීම සිදුකරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේදී ආදර්ශ තේ වගා ව්‍යාපෘති 26 ක් සඳහා අනුමැතිය සහ ලියාපදිංචිය හිමිව ඇති අතර පළමු අදියරේදී රු.5,400,000 ක සහනාධාර මුදලක් නිකුත් කරන ලද ව්‍යාපෘති 18 ක දෙවන අදියර සඳහා වන ජල සම්පාදන පද්ධතිය ස්ථාපිත කිරීම (Installation of Irrigation System) හා සම්බන්ධ කටයුතු 2021 දෙසැම්බර් 31 දින වන විට ක්‍රියාත්මක නොකර ඇතිබවත් ව්‍යාපෘති 06 ක කිසිදු ප්‍රගතියක් නොමැති බවත් නිරීක්ෂණය විය. | පළමු අදියර සඳහා සහනාධාර නිකුත් කර ඇති ව්‍යාපෘති 18 ක ජල සම්පාදන පද්ධති ස්ථාපනය කර නොතිබුණි. ජල සම්පාදන පද්ධති ඉදිකිරීම මෙම ව්‍යාපෘතියේ අදියර 04 න් එක් අදියරකි. එම අදියර සම්පූර්ණ කිරීමට වගා කරුවන් දැනුවත් කර ඇති අතර අදියර සම්පූර්ණවීමෙන් පසු සහනාධාර ගෙවීම් සිදු කර ඇත. | මණ්ඩලයේ මනා අධීක්ෂණයෙන් ව්‍යාපෘති සියල්ලම ආරම්භ කර සාර්ථකව අවසන් කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග හඳුන්වා දිය යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)ශ්‍රී ලංකා තේවල ඇතුළත් Methyl Chloro Phenoxyacetic Acid (MCPA) ශේෂය පරික්ෂා කිරිමට නව Liquid Chromatography Tendem Mass Spectrometer (LCMS/MS) උපකරණයක් මිලදී ගැනීම සඳහා ජාතික තරඟකාරී මිල කැඳවීම මගින් 2020 නොවැම්බර් 23 දින දෙහිවල ප්‍රදේශයේ පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත රු. 69,373,510 ක මුදලකට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ 4.3.2 පරිදි Liquid Chromatography Tendem Mass Spectrometer (LCMS/MS) යන්ත්‍රය ස්ථාපනයට පසුව ISO 17025 පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව වාණිජමය වශයෙන් තේ නියැදි පරික්ෂා | රසායනාගාරය වෙත MCPA පරීක්ෂාව සඳහා යොමු කළ වාණිජ නියැදිය 2021.07.21 දිනයෙහි විශ්ලේෂණය කර එම ප්‍රතිඵලවල නිරවද්‍යතාවය MCPA සඳහා ප්‍රතීතකරනය වූ ITI ආයතනයෙන් තහවුරු කර ගෙන, එයද පදනම් කොට ගෙන තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය සමග 2021.07.29 දින අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) විසින් ගෙවීම නිර්දේශ කර ඇත.<br>තේ මණ්ඩලය විසින් අදාල ප්‍රසම්පාදනය නිමවා සැපයුම්කරුවන්ගෙන් එම LCMS /MS යන්ත්‍රයට විශේෂිත රසායන ද්‍රව්‍ය ලැබී තිබුනේ 2021 නොවැම්බර් අග භාගයේදීය. ඉන් පසු 2021 දෙසැම්බර් 01 සිට තේ කර්මාන්තය වෙත රසායනාගාර | කොන්ත්‍රාත් ගිවිසුමේ පරිදි යන්ත්‍රය ස්ථාපනයට පසුව ISO 17025 පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව තේ නියැදි පරීක්ෂා කිරීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත මුදල නොගෙවීම් සම්බන්ධව පරීක්ෂණයක් සිදු කළ යුතු අතර යන්ත්‍රය පූර්ණ උපයෝජනය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

කිරීමෙන් පසු තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත සියයට 50 ක දෙවන අත්තිකාරම් මුදල ගෙවිය යුතුව තිබුණි. එසේ වුවද, වාණිජ නියැදි මත පදනම්ව පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම 2021 දෙසැම්බර් 01 දින සිට සිදුකර තිබුණු අතර ඊට පෙර ලංසු ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව ලංසු වටිනාකමින් සියයට 50 ක් එනම් රු.34,917,055 ක මුදලක් 2021 අගෝස්තු 10 දින ගෙවා තිබුණි.තවද යන්ත්‍රය ඉහළ ධාරිතාවයක් සහිත වුවද 2022 මැයි 25 දින වන විටදී මෙම යන්ත්‍රය භාවිතයෙන් MCPA පරීක්ෂණ 27 ක් පමණක් සිදුකර තිබුණු බව විගණනයට දන්වා තිබුණි. කර්මාන්තය තුළ පවතින රසායනාගාර පරීක්ෂණ අවශ්‍යතාවය ප්‍රමාණවත් ලෙස හා අප්‍රමාදව ඉටුකිරීමෙන් තොරව උපයෝජනය අඩුමට්ටමක පැවතුනද සැමවිටම වායුසමීකරණ තත්ත්වයක් යටතේ ඉහළ පිරිවැයක් ද දරමින් මෙම යන්ත්‍රය නඩත්තු කළ යුතු බවද තවදුරටත් නිරීක්ෂණය විය.

චක්‍රලේඛයක් මගින් දැනුම් දී අදාළ පරීක්ෂණ නිකුත් කිරීම ආරම්භ කරන ලදී.
ඉහත උපකරණය භාවිතයෙන් MCPAවලට අමතරව තවත් පළිබෝධනාශක පරීක්ෂා කළ හැකි අතර තේ කර්මාන්තයේ ඉල්ලීම මත විටින් විට එම පරීක්ෂණ හඳුන්වා දී ඇත.
රසායනාගාරයේ මේ වන විට පවතින ස්ථිර තනතුරු සඳහා සේවක පුරප්පාඩු පිරවීමෙන් පසු, සහ අදාළ විශේෂිත වූ රසායන ද්‍රව්‍ය සියල්ල ආනයනය කළ යුතු බැවින් එම ද්‍රව්‍ය ආනයනය සඳහා සැපයුම්කරුවන් වෙත බලපා ඇති විදේශ සංචිත පිළිබඳ ගැටලු නිරාකරණය වීමෙන් පසු අදාළ උපකරණය පූර්ණ උපයෝගිතාවයට භාජනය කළ හැකි වේ.

(ආ) අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් භාවිතයට ගෙන නොතිබුණු, 2009 වර්ෂයේදී රු.32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පළිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය (Liquid Chromatography Mass Spectrometer) මිලදී ගැනීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳ එවකට රසායනාගාරයට අනියුක්තව සේවය කළ සහකාර අධ්‍යක්ෂකවරයාට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇතැත් විධිමත් විනය පරීක්ෂණය අවසන් කර ශ්‍රී ලංකා තේ මණ්ඩලයට සිදු වූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන්

විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමෙන් අනතුරුව පරීක්ෂණ වාර්තාව ආයතනය වෙත ලැබී ඇති අතර එම වාර්තාව 2022.07.08 දින පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයට සිදු වූ අලාභය වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයට අයත් පිරිවැය රු. 1,800,000 ක් බැගින් වූ කැබ් රථ දෙකක් 2017 නොවැම්බර් 28 දින ජාතික වැවිලි කළමණාකරන ආයතනය වෙත පරිහරණය සඳහා ලබාදීමට කටයුතු කර තිබුණද 2022 අප්‍රේල් 30 විගණන දින වන විටත් මුදල් අයකර ඉහත වාහනවල නීත්‍යානුකූල අයිතිය පවරාදීමට කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදීද මණ්ඩලයේ ප්‍රවාහන අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රු. 2,204,213 ක් වැය කරමින් පුද්ගලික කුලී රථ භාවිතා කර තිබුණි. | වැවිලි අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය පරිදි අදාළ වාහන දෙක ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් තක්සේරු වටිනාකම ගෙවා නිම කළ පසු එහි අයිතිය පවරා දීමට යටත්ව එම ආයතනයට ලබා දී ඇත. 2022/06/01 දිනැති ලිපිය මඟින් ඉහත වාහන 02 සඳහා වාරික වශයෙන් මුදල් ගෙවන ලෙස දන්වා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වෙත දැනුම් දී ඇත. | මුදල් අයකිරීමෙන් පසුව පමණක් වාහනවල අයිතිය පවරා දීමට කටයුතු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත කාර්යය මණ්ඩලය 328 ක් වූ අතර සත්‍ය කාර්යය මණ්ඩලය 262 ක් විය. ඒ අනුව ඉහළ කළමනාකරණ මට්ටමට අයත් වන නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු 03 ක් (වර්ෂ 02 සිට මාස 06 ත් අතර) ඇතුළුව පුරප්පාඩු වූ තනතුරු 66 ක් වූ අතර ඒවා පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීම රජය මඟින් තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් පුරප්පාඩුව පවතී. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට කටයුතු කළ යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම හා එහි ප්‍රගතිය අනුව මණ්ඩලයේ රු.මිලියන 525 ක ඇස්තමේන්තුගත ක්‍රියාකාරකම් තුනක මූල්‍ය ප්‍රගතිය සියයට 09 ත් සියයට 37 ත් අතර පැවති අතර, භෞතික ප්‍රගතිය සියයට 0 ත් සියයට 22 ත් තරම් අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සැලසුම්කර තිබුණු නිවැරදිව තේ දළු නෙලාගැනීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන, යාන්ත්‍රිකව තේ දළු නෙලා ගැනීම සහ තේ කර්මාන්තශාලාවල සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම වැනි ක්‍රියාකාරකම් 14 ක භෞතික ප්‍රගතිය එහි ඉලක්කගත භෞතික ප්‍රගතියට වඩා සියයට 50 ට අඩු මට්ටමකින් පැවතුන බව නිරීක්ෂණය විය. තවද සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 325 ක ඇස්තමේන්තුගත ව්‍යාපෘති 2 කට අදාළ භෞතික ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණු අතර ඉන් රු. මිලියන 210 ක ක්‍රියාකාරකම් වෙනුවෙන් මූල්‍ය ප්‍රගතිය සම්බන්ධ තොරතුරු ද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වසරේ සිට නිශ්චිත වගකිව යුතු පුද්ගලයින් වෙන වෙනම හඳුනාගෙන ක්‍රියාකාරී සැලැස්ම සැදීමට කටයුතු කරනු ලැබේ. රු.මිලියන 525 ක ඇස්තමේන්තුගත ක්‍රියාකාරකම් තුනක මූල්‍ය ප්‍රගතිය අඩුවීමට හේතු විසිරි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලැබුනේ 3 වන කාර්තුවේදි බැවින් ජල සම්පාදන පද්ධති ස්ථාපනය කිරිම අවසන් කිරිමට කාලය ප්‍රමාණවත් නොවීම, සමාජ මාධ්‍ය හරහා සැලසුම් කර තිබූ ගෝලීය ප්‍රවර්ධන කටයුතු ඇණහිටීම හේතුවෙන් ඒ සඳහා වෙන්කර තිබූ මුදල් හි ප්‍රමාණාත්මක වැයවීමක් සිදු නොවීම වෙළෙඳ ප්‍රදර්ශන අවලංගු කිරීම හා කල් දැමීම් හේතුවෙන් ඉලක්ක ගත මූල්‍ය හා භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි විය.<br>සමාලෝචිත වර්ෂයේ සැලසුම් කර තිබුණු ක්‍රියාකාරකම්හි අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට නොහැකිවීමට ප්‍රධාන වශයෙන් කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වූ පුද්ගලයින් එක් රැස්කිරීම සඳහා වූ බාධක හේතු විය. තේ කර්මාන්තශාලාවල සූර්ය බලශක්ති නිෂ්පාදනය කිරීමේ මූලික කටයුතු ප්‍රමාදයක් ඇති වුවත් මේ වන විට අදාල මූලික ගෙවීම් කටයුතු සියයට 50 ට වඩා වැඩි ප්‍රමාණයක් අවසන් කොට ඇත. සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම සඳහා ඉල්ලුම්කරුවන් අඩු මට්ටමක පැවතීම ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රගතියක් අත්පත් කර ගැනීමට වගකීම් නිසිපරිදි පැවරීමට සහ කාර්තුමය වශයෙන් මනා අධීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |